# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 160/10 — 1975 අප්‍රේල් 19 වැනි සෙනසුරාද — 1975.04.19

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)

# I වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ජනා. කා. අංකය : ඩබ්ලිව්. 68(50)/75.

**මහාජන ආරක්ෂක ආඥාපනත (40 වැනි අධිකාරය)**

අගමැතිගේ නිර්දේශය අනුව මහාජන ආරක්ෂක ආඥාපනතේ 5 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලැබූ නියෝග.

වි. ගොපල්ලව,
ජනාධිපතිවරයා.

1975 අප්‍රේල් මස 19 වැනි දින,
නුවරඑළියේ දී ය.

### නියෝග

1. යම් බන්ධනාගාරයක සිරභාරයේ තබනු ලැබ සිටින්නාවූ ද පුපුරන ද්‍රව්‍ය පනත, 1966 අංක 18 දරන පිඩාකර ආයුධ පනත, තුවක්කු ආඥාපනත හෝ දණ්ඩ නීති සංග්‍රහයේ VI වැනි පරිච්ඡේදය, VII වැනි පරිච්ඡේදය හෝ VIII වැනි පරිච්ඡේදය හෝ යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වරදකට සැක කරනු ලැබ හෝ චෝදනා ලැබ සිටින්නාවූ ද යම් තැනැත්තකුට මේ නියෝග අදාළ විය යුතුය.

2. අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් විසින් බන්ධනාගාර කොමසාරිස් වෙත යවනු ලබන ලිඛිත ආඥාවක් මගින් ලේකම් විසින් ඒ ආඥාවේ නිශ්චය කොට දක්විය හැකි නියම හා කොන්දේසි කිසිවක් වේනොත්, ඒවාට යටත්ව, මේ නියෝග අදාළ වන යම් තැනැත්තකු සිරභාරයෙන් නිදහස් කරන ලෙස හෝ නිදහස් කරවන ලෙස විධාන කළ හැකිය.

3. ලේකම් විසින් 2 වැනි නියෝගය යටතේ නිකුත් කරන ලද ආඥාවක් තමන් වෙත ලැබුණු කල්හි ඒ ආඥාව ක්‍රියාවේ යෙදවීම බන්ධනාගාර කොමසාරිස්ගේ කාර්ය විය යුතුය.

4. නියම හෝ කොන්දේසි කිසිවකට යටත්ව, 2 වැනි නියෝගය යටතේ යම් තැනැත්තකු නිදහස් කරනු ලැබූ අවස්ථාවක, ඒ නියම හෝ කොන්දේසි අනුව කටයුතු කිරීම හෝ ඒවා පිළිපැදීම ඒ තැනැත්තාගේ කාර්ය විය යුතු අතර එසේ කිරීම පැහැර හැරීම වරදක් වන්නේය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

41A—ජ 13574—2,100 (75/04)